# රාගධාරී සංගීතයේ ථාට දෙකක් ක්‍රමවේදයට පරිබාහිරව නම් කිරීම පිළිබඳ විමර්ශණයක්

ඩබ්ලිව්.කේ. රුවින් රංගීත් ඩයස්
උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය, සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07.

---

## ABSTRACT

හින්දුස්තානි රාගධාරී සංගීතයෙහි යෙදෙන ථාට දහය අතුරින් ඛමාජ් සහ මාර්වා යන ථාට නම් කිරීමේ දී සෙසු ථාට නම් කිරීමට යොදාගෙන ඇති ක්‍රමවේදය අනුගමනය නොකර ඇති බව ථාට නාම නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන කරුණකි. මෙම ගැටළුව පිළිබඳ සාකච්ඡා කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණයි.

දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ යෙදෙන රාග වර්ගීකරණය සඳහා ගණිතානුසාරව මේල 72 ක් නිර්මාණය කිරීම 1620 දී පමණ ව්‍යංකටමුඛී පඬිතුමා විසින් සිදු කරන ලද්දකි. පසුකාලීනව 1906 දී පමණ හින්දුස්තානි සංගීතයේ රාග වර්ගීකරණය සඳහා විශ්ණු නාරායණ් භාත්ඛණ්ඩේ පඬිතුමා විසින් ථාට නොහොත් මේල 10 ක් හඳුන්වා දුන් අතර ඒ සඳහා ඒ ඒ ථාට වල ගතිලක්ෂණ ඇති ප්‍රචලිත මෙන්ම සම්පූර්ණ ජාතියට අයත් රාගයක නමින් එම ථාට නම් කරන ලදී.

එසේ වුවද එම ථාට 10 අතරින් එක් ථාටයක් කෝමල ඍෂභය සහ තීව්‍ර මධ්‍යමය යෙදෙන මුත් පංචමය වර්ජිතව ෂාඩව ජාතියට අයත්වන මාර්වා රාගයේ නමින් නම් කර ඇත. මාර්වා රාගයේ පංචමය වර්ජිත වන බැවින්, කෝමල ඍෂභය සහ තීව්‍ර මධ්‍යමය යෙදෙන ස්වර ශුද්ධව සම්පූර්ණ ජාතියට අයත්ව යෙදෙන ප්‍රචලිත රාගයක් වන පූරියා කල්‍යාණ රාගයේ නමින් එම ථාටය නම් කිරීම වඩාත් යෝග්‍යය යැයි හැඟේ.

එමෙන්ම එම ථාට 10 අතරින් තවත් ථාටයක් ආරෝහණයේ ශුද්ධ නිෂාදය සහ අවරෝහණයේ කෝමල නිෂාදයත් සෙසු ස්වර ශුද්ධවත් යෙදෙන ඛමාජ් රාගයේ නමින් නම් කර ඇත. නමුත් එහි ආරෝහණයේ ඍෂභය වර්ජ්‍යව ෂාඩව සම්පූර්ණ ජාතිව යෙදෙන බැවින් එම රාගයේ නමින් එම ථාටය නම් කිරීමට වඩා කෝමල නිෂාදය සමග අනෙකුත් ස්වර ශුද්ධව යෙදෙන සම්පූර්ණ ජාතියට අයත් වූ ප්‍රචලිත රාගයක් වන ජිංජුටි රාගයේ නමින් එම ථාටය නම් කිරීම වඩාත් යෝග්‍ය යැයි හැඟේ.

මෙම පර්යේෂණ පත්‍රිකාව තුළින් පූර්වෝක්ත ගැටලුව කෙරෙහි සෙසු විද්වතුන්ගේ අවධානය යොමුකරවීමටත්, ඒ පිළිබඳ යෝජනා ඉදිරිපත් කරවීමටත් අපේක්ෂිතයි.